විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2015(සංශෝධන II)

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2016.09.07

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

## විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම. (විශ්‍රාම අයදුම්පත් මාර්ගගතව (online) යොමු කිරීම.)

උක්ත කරුණ සම්බන්ධව ම`විසින් නිකුත් කරන ලද 2015.04.24 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2015 හා 2015.10.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2015 (සංශෝධන I ) උපදෙස් වලට අමතර වශයෙනි.

විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මාර්ගගතව (online) සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම සේවාවන් සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.pensions.gov.lk හි PMS (Pension Management System) ලෙස විශේෂ යොමුවක් (link) ඔස්සේ සම්බන්ධ විය හැක.

### ජාලගත සේවාවන් සඳහා පිවිසීම

මෙම සේවාව ප්‍රථම වරට ලබා ගැනීමේ දී අදාළ රාජ්‍ය ආයතනය හා භාවිත කරන නිලධාරීන් ලියාපදිංචි විය යුතු අතර ඉන් අනතුරුව ලබා දෙන මුර පද (Password) භාවිත කර පද්ධතියට ඇතුළු විය හැක. මෙම මෘදුකාංගය දැනටමත් වැන්දඹු අනත්දරු ලියාපදිංචි ක්‍රියාවලියට යොදා ගන්නා මෘදුකාංගයේම වැඩි දියුණු කළ සේවාවක් වන අතර මේ සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති රාජ්‍ය ආයතන නැවත ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.

### මෙමගින් ලැබෙන සේවාවන්

1. රාජ්‍ය නිලධාරියෙකු විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී විශ්‍රාම වැටුප් අයදුම්පත (PD 03) මාර්ගගතව (online) යොමු කිරීමට හැකිවීම.
2. ස්වයංක්‍රියව විශ්‍රාම වැටුප් අංකය නිකුත් කිරීම.
3. ප්‍රදාන පත්‍රයේ ආකෘතිය (භාණ්ඩාගාර 79) මුද්‍රණය කර ගැනීමේ පහසුකම (මෙය ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ පසු වලංගු වේ.)
4. විශ්‍රාම වැටුප හිමි ගැන්වීමේ ක්‍රියාවලියට අදාළ අදියරයන්හි දී ඒ පිළිබඳ විශ්‍රාමිකයා කෙටි පණිවුඩ (SMS) මඟින් දැනුවත් කිරීම.

ඉහත සේවාවන් සඳහා පිවිසීම සම්බන්ධ සම්පූර්ණ උපදෙස් මාලාව ඇමුණුම 01 ලෙස මෙම චක්‍රලේඛයට අමුණා ඇත. ඊට අමතරව www.sathkara.pensions.gov.lk/guidelines යන වෙබ් යොමුව (Web link) මගින් ඉහත මෘදුකාංගය භාවිත කරන ආකාරය ශ්‍රව්‍ය දෘශ්‍ය (video) මාධ්‍යයෙන් ද දැක බලා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

<u>ක්‍රියාත්මක වීම</u>

**මෙම සේවාව 2016.10.10 දින සිට ක්‍රියාත්මක වන අතර එදින සිට පැරණි ක්‍රමවේදය මගින් එවනු ලබන විශ්‍රාම වැටුප් අයදුම්පත් (PD 03) භාර ගනු නොලැබේ. (2016.10.10 දිනට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් සඳහා මෙම ක්‍රමය අදාළ කර නොගත යුතුය.)**

රාජ්‍ය සේවයේ කාර්යක්ෂම හා ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණයේ භාවිතය වැඩි දියුණු කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ගන්නා ක්‍රියාමාර්ගයන් සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ සහයෝගය අපේක්ෂා කරමි.

මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාවය මත නිකුත් කෙරේ.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ. සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - එම
3. අමාත්‍ය මණ්ඩල ලේකම් - එම
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය - එම
5. විගණකාධිපති - එම